හාලිඇල ප්‍රාදේශීය සභාව
බදුල්ල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 07 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ විදුලි උපපොලේ වටිනාකම රු. 100,000 ක් ලෙස ඉදිරිපත්කර තිබුණද, එවැනි ස්ථාවර වත්කමක් සභාව සතුව නොපැවැතුනි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |
| (ii) | රු. 38,498 ක් වටිනා පාරිභෝගික භාණ්ඩ, ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |
| (iii) | ඉකුත් වර්ෂ සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු පිළිවෙලින් රු. 154,400 ක් සහ රු. 48,225 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | පිළිගන්නා අතර, රු. 48,225 ක ශේෂය 2019 වර්ෂයේදී ගැලපීම් කරන බව සහ රු. 154,400 ක් පිළිබඳව තොරතුරු නොමැති බැවින් ඉදිරි වර්ෂවලදී කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ රු. 9,310,191 ක් වැඩියෙන් සහ හිඟ මුද්දර ගාස්තු රු. 9,684,172 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |
| (v) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ඉදිරි වර්ෂයේදී ගෙවිය යුතු රු. 2,016,943 ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කරන ලද කර්මාන්ත 10 ක් සඳහා රු. 69,265 ක් වැඩියෙන් ණයගැති සහ ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |
| (vii) | සේවක ඇප තැන්පත් ආයෝජන රු. 27,702 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |
| (viii) | ඉකුත් වර්ෂවලදී අපහරණය කරන ලද රු. 392,553 ක යන්ත්‍රෝපකරණ වල වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | වරද පිළිගන්නා අතර, ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |

(ආ) <u>අසම්භාව්‍ය බැරකම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 2 ක් විසින් පවරා තිබුණු නඩු 2 ක් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | වරද පිළිගන්නා බව සහ ඉදිරි වර්ෂයේදී ගැලපීම් කරමි. |

(ඇ) <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 6 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ එම උපලේඛන අනුව ශේෂ අතර රු. 91,577,297 ක වෙනසක් පැවතුනි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීන කර නොසැසඳීම් වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | වෙනස පිළිගන්නා බවත් නැවත පරීක්ෂා කර ඉදිරි වර්ෂයේ නිවැරදි කරමි. |

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------------------------------------- | -------------------- | ----------------------------- |
| රු. 53,260,104 ක වත්කම් විෂයයන් 4 ක් සහ රු. 61,105,493 ක එක් වගකීම් විෂයයක් තක්සේරු වාර්තා, යාවත්කාලීන කරනලද ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, ශේෂ තහවුරුකිරීම් සහ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | විගණනයට අදාල වන සාක්ෂි ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|---|
| -------------------------- | --------------------------------- | ------------------ | ----------------------- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව වාර වාර්තා කැඳවිය යුතුවේ. | ඉදිරි වර්ෂවලදී වාර වාර්තා කැඳවීම් කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| 396 (ඈ) වගන්තිය | රු. 21,250 ක් වටිනා නිකුත්කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් 6 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල ආයතන වලට සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර, ශේෂ ඉදිරියේදී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br><br>xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ සේවය කළ සේවකයින් 14 දෙනෙකුගෙන් වර්ෂ 6 කට අධික කාලයක සිට අයවිය යුතු රු.153,723 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකරගත යුතුවේ. | රු. 94,411 ක් අයකර ගැනීමට කටයුතු කරන අතර, අනෙකුත් ශේෂයන්ට අදාලව ලිපි ලේඛන නොමැති බැවින් එම ශේෂ ඉදිරියේදී කපා හරිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,687,228 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,943,245 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරුපහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,665,374 | 2,672,797 | 2,222,144 | 3,176,496 | 2,529,820 | 3,173,940 | 3,173,101 | 2,725,842 |
| (ii) | කුලී | 586,022 | 579,382 | 402,315 | 513,443 | 483,302 | 577,246 | 573,061 | 348,376 |
| (iii) | වෙනත් ආදායම් | 2,135,000 | 2,197,627 | 2,256,531 | 1,367,864 | 2,123,000 | 2,092,193 | 747,856 | 1,426,767 |
| | එකතුව | 5,386,396 | 5,449,806 | 4,880,990 | 5,057,803 | 5,136,122 | 5,843,379 | 4,494,018 | 4,500,985 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් බදු | | |
| (i) වරිපනම් බදු අයකිරීමට සුදුසු ප්‍රදේශ 2012 වර්ෂයේ හඳුනාගෙන තිබුණු අතර ඉන්පසු කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට අවධානය යොමුකර නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ කලින් කළ හඳුනාගෙන අදාල ක්‍රියාමාර්ග අනුගමනය කර වරිපනම් බදු අයකරගත යුතුවේ. | ඉදිරියේදී දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ii) සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු. 2,610,831 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට හිඟය රු. 1,383,513 ක් වූ අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 53 ක් විය. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අය කර ගනිමි. |
| (iii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 2,699,343 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 1,846,845 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | දේපල තහනමක් සිදුකර හිඟයෙන් කොටසක් අය කරගෙන ඇති අතර, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) <u>බදු කුලී</u><br>සභාවට අයත් දේපල 2 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 32,210 ක බදු මුදල් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු බදු මුදල් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගනිමි. |

2.2.3 <u>කඩකාමර කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩකාමර 25 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 83,559 ක කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | කඩ කාමර 25 න් කඩකාමර 2 ක් සභාවට අයිති බව තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි නොමැති අතර ඉතිරි කඩකාමර 23 න් ඉදිරියේ කුලී අයකර ගනිමි. |

2.2.4 <u>ස්ථාවර වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 202,625 ක ස්ථාවර වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | පිළිගන්නා අතර රු. 48,225 ක ශේෂය 2019 වර්ෂයේදී ගැලපීම් කරන අතර, රු. 154,400 ක් පිළිබඳව තොරතුරු නොමැති |

| | | |
|---|---|---|
| | | බැවින් ඉදිරි වර්ෂවලදී කටයුතු කරමි. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 12,951,800 ක් හා හිඟ මුද්දර ගාස්තුව රු.21,449,152 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 24 ක් සම්බන්ධයෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | පනවා නොමැති අතුරු ව්‍යවස්ථා 06 ඉදිරි වර්ෂයේදී පැනවීමටත්, ඒවා ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණද, වර්ෂය තුලදී තථ්‍ය වශයෙන් සිදුකරන ලද ක්‍රියාකාරකම් හඳුනාගෙන නොතිබුණු බැවින් වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ හැකියාව අහිමිවී ගොස් තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර වර්ෂය අවසානයේදී කාර්යසාධනය ඇගයීමට ලක්කළ යුතුවේ. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ක්‍රියාකාරකම් ඇතුළත් කර ඒ අනුව කාර්යසාධනය ඇගයීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී නොතිබුණු අතර සභාවට අදාල කරගත හැකි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කද හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | අරමුණු හඳුනාගෙන අවශ්‍ය කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභා බලප්‍රදේශයේ සිදුකර තිබුණු අනවසර ඉදිකිරීම් හඳුනා ගැනීමට සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදු කරමි. |
| (ආ) | 2010 වර්ෂයේ දී ආරම්භකර තිබුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------------------------- | ------------------------ | ---------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 07 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සිටි සේවකයන් 29 දෙනෙකුගේ තනතුරු අනුමත කරගෙන නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ තනතුරු අනුමත කර ගත යුතුවේ. | තනතුරු අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 09 කට අදාලව පැවති සේවක පුරප්පාඩු 20 ක් පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | තනතුරු 3 ක පුරප්පාඩු මේ වන විට සම්පූර්ණ වී ඇත. |

3.4 <u>වත්කම් කළමනාකරණය</u>
<u>වාහන පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------------------------- | -------------------- | ----------------------------------- |
| (අ) <u>වාහනවල අයිතිය පවරා නොගැනීම</u><br>2014 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු කැබ් රථයක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | වාහනවල අයිතිය පවරාගත යුතුවේ. | ගෙවීම් අවසන් වූ පසු පවරා ගනිමි. |

(ආ) <u>ඉන්ධන දහනය පරීක්ෂාව</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------------------------- | ------------------------ | ------------------------------ |
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 13 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කරන ලෙස පළාත් යාන්ත්‍රික ඉංජිනේරු වෙත දැනුම්දී ඇත. |

3.5 <u>ප්‍රසම්පාදනය</u>
<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා සකස් කරමි. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>
4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේඅදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි චක්‍රලේඛ අංක ඩීඑම්ජී/ 2009 (01) දරන 2009 ජුනි 09 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | සභාව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවිය යුතුවේ. | දැනට විගණන හා කළමනාකරණ කමිටුව සක්‍රීයව පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |